**අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව**

**හම්බන්තොට දිස්ත්‍රික්කය**

**1 මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 23 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ **1.3** ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුළ ඉටු කර නොමැති කර්මාන්ත 04 ක් වෙනුවෙන් රු. 580,000 ක ණයහිමි ප්‍රතිපාදන ඇති කිරීම හේතුවෙන් ප්‍රාග්ධන වියදම් හා ණයහිමියන් එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි.

(ආ) 2009 වර්ෂයේදී මිලට ගෙන තිබුණු රු. 283,500 ක් වටිනා කසළ ප්‍රවාහන ටේලරයේ සහ සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ රු. 204,640 ක් වූ පරිගණකවල වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම හා වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ ආදායම රු. 105,618 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේදී මිලදී ගෙන ගිණුම්ගත කර තිබූ රු. 63,710 ක් වූ පුස්තකාල පොත්වල වටිනාකම සමාලෝචිත වර්ෂයේදී නැවතත් ගිණුම්ගත කර තිබීම නිසා පොත් තොගයේ වටිනාකම ද්විගණනය වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ, ලැබී තිබූ ලීටර් 2000 ජල ටැංකි 5 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

----------------------------

මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් ගිණුම් විෂයයන් 06 ක ශේෂයන්, ඊට අදාළ පොත්පත්, උපයෝගී ලේඛන හා උපලේඛන වල දැක්වෙන ශේෂයන් අතර නිරීක්ෂණය වූ අසමානතාවල එකතුව රු. 2,112,552 ක් විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්

-------------------

i. සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,523,158 ක් වූ හිඟ මෝටර් ග්‍රේඩර් ආදායම අයකර ගැනීමට සහ රු. 1,081,509 ක් වූ නොපියවූ අත්තිකාරම් ශේෂ 39 ක් හා නිරවුල් නොවූ ගනුදෙනු ලෙස වර්ෂ ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශන වලින් ඉදිරියට ගෙනැවිත් පවතින රු. 10,240 ක ශේෂය නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

ii. විවිධ ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මත සමාලෝචිත වර්ෂය අවසාන වන විට අයවිය යුතුව තිබූ ප්‍රාග්ධන ආධාර ශේෂය රු. 17,769,483 ක් වූ අතර, ඉන් රු. 504,898 ක් 2016 වර්ෂය වෙනුවෙන් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්

---------------------

i. 2013 වර්ෂයේ සිට දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කළ යුතු රු. 516,079 ක ජාතිය ගොඩනැගීමේ බදු මුදල් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත ගෙවිය යුතු රු. 35,208 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගෙවීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

ii. සමාලෝචිත වර්ෂය අවසාන දිනට විවිධ ණයහිමි ශේෂය රු. 19,965,127 ක් වූ අතර, ඉන් රු. 1,070,139 ක් ඉකුත් වර්ෂයට අදාළ විය.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 122,081,612 ක් වූ ගිණුම් විෂයයන් 08 ක් හා රු. 1,692,250 ක් වූ එක් ගනුදෙනුවක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| i. 193 රීතිය | අයවැයගත මූල්‍ය ප්‍රතිපාදන හා පරිපූරක සම්මත සමඟ සසඳා එක් එක් ආදායම් විෂයයන් හා වැය විෂයයන් යටතේ වන අතිරික්තයන් හෝ ඌණතාවයන් පිළිබඳ කරුණු පැහැදිලි කරන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| ii. 217 රීතිය | සභාව සතු කරන ලද, සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන සියළුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ තොරතුරු ඇතුළත් කර පී.එස්. 46 ආකෘතිය ප්‍රකාර ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| i. මුදල් රෙගුලාසි 110 | හානි පාඩු ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| ii. මුදල් රෙගුලාසි 371(5) | ලබා දෙනු ලබන අත්තිකාරම් අදාළ කාර්යය නිමකළ විගසම පියවිය යුතු වුවත්, සභාව විසින් අවස්ථා 40 කදී ලබාදී තිබූ රු. 871,261 ක අත්තිකාරම් මුදල් 2018 ජනවාරි 24 දින වන විටත් පියවා නොතිබුණි. |
| iii. මුදල් රෙගුලාසි 396(ඈ) | ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06 ක කාලයක් ඉක්මවූ එකතුව රු. 108,984 ක් වූ චෙක්පත් 26 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| iv. මුදල් රෙගුලාසි 571 | තැන්පත් කළ දින සිට වසර දෙක ඉක්මවූ රු. 1,570,517 ක් වූ විවිධ තැන්පත් ශේෂ 205 ක් සහ රු. 132,349 ක් වූ රැඳවුම් තැන්පතු ශේෂ 14 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2010 අගෝස්තු 17 දිනැති හා පීරී/01/01 අංක දරන විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් වීථි පහන් 2,070 ක් නඩත්තු කර තිබූ නමුත්, ඒ පිළිබඳ විදුලි බල මණ්ඩලය වෙත අයදුම් කිරීමට කටයුතු නොකිරීම නිසා වීථි පහන් 350 ක් සඳහා පමණක් ගාස්තු ප්‍රතිපූර්ණය වී තිබුණි. |
| (ඈ) 2014 පෙබරවාරි 24 දිනැති හා 01/2014 අංක දරන දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛය | සභාවේ සේවකයන්ගෙන් ඇප මුදල් ලබා ගෙන නොතිබුණි. |

**1.3.6 අධිකාරී බලය නොලත් ගණුදෙනු**

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයෙන් වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබුණු රු.19,571,000 ක ප්‍රතිපාදන ඉක්මවමින් රු. 7,384,420 ක් වියදම් දරා තිබුණු අතර, එම වැඩිපුර දරන ලද වියදම් පියවා ගැනීම සඳහා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 14(1) සහ 14(2) විධිවිධාන වලට අනුකූලව කටයුතු කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,703,288 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 5,331,307ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 310,000 | 362,595 | 283,645 | 262,361 | 270,000 | 365,230 | 279,405 | 229,861 |
| (ii) කුලී | 12,063,500 | 13,180,863 | 11,946,674 | 1,563,323 | 12,166,000 | 11,896,325 | 11,347,979 | 845,906 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,021,500 | 809,104 | 796,604 | 97,965 | 1,080,400 | 928,786 | 928,786 | 89,940 |
| (iv) වෙනත් ආදායම් | 3,566,800 | 3,903,933 | 1,403,307 | 3,975,566 | 2,514,600 | 3,454,636 | 692,226 | 3,680,820 |
| එකතුව | 16,961,800 | 18,256,495 | 14,430,230 | 5,899,215 | 16,031,000 | 16,644,977 | 13,248,396 | 4,846,527 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-----------------------------------

සමාලෝචිත වර්ෂයට රු. 18,256,495 ක ආදායම් බිල් කර තිබූ අතර, ඉන් රු. 14,430,230 ක මුදලක් අයකර තිබුණි. ඉකුත් වර්ෂය අවසානයට පැවති රු. 4,846,527 ක් වූ හිඟ ආදායම සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු. 5,899,215 ක් දක්වා වර්ධනය වී තිබුණි.

### 2.2.3 වරිපනම් බදු

-------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියට අනුකූලව වරිපනම් බදු පනවා අයකර ගැනීමට 2018 ජනවාරි 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

### 2.2.4 කුලී

----

දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති හා දපපා/පපාකො/ 2010/01 අංක දරන චක්‍රලේඛයේ 06 වන ඡේදයට අනුකූලව කඩ කාමර වසර පහකට වරක්වත් තක්සේරු කර බදු කුලිය සංශෝධනය කළ යුතු වුවත්, අඟුණකොළපැලැස්ස කඩ කාමර 10 තක්සේරු කර නොතිබුණ අතර, දෙබොක්කාව කඩ කාමර හතර අවසන් වරට තක්සේරු කර තිබුණේ 2007 වර්ෂයේදී ය.

### 2.2.5 බලපත්‍ර ගාස්තු

---------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(2) වගන්තිය අනුව විවිධ වෘත්තීන් සම්බන්ධයෙන් බලපත්‍ර ගාස්තු පනවා අය කර ගැනීමට කටයුතු කළ යුතු වුවත්, සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක නීතිඥ, වෛද්‍ය, නොතාරිස් හා රෙජිස්ට්‍රාර් වැනි වෘත්තීන් වලින් බලපත්‍ර ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149, 150 සහ 152 වගන්ති ප්‍රකාර බලපත්‍ර ගාස්තු අය නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට රු. 84,225 ක් අය විය යුතුව පැවතුණි.

(ඇ) 2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගත යුතු වීමෝල් හා ඇඹරුම්හල් යනාදී ආයතන විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීමෙන් තොරව ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන ගොස් තිබුණි.

(ඈ) සභා බල ප්‍රදේශයේ පවත්වා ගෙන යන ඇතැම් ව්‍යාපාර ආයතන විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගෙන තිබුණද වෙළඳ බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.6 ව්‍යාපාර බදු

------------

සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු ව්‍යාපාර බදු වටිනාකම රු. 238,385 ක් වූ අතර, එම හිඟ මුදල අය කර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්තිය අනුව කටයුතු කර නොතිබුණි.

**2.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 3,191,424 ක් හා මුද්දර ගාස්තු රු. 1,097,113 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාත්මක නොකළ කර්තව්‍යයන්

වාර්ෂික අයවැය ලේඛනයේ සහා අරමුදල් යටතේ සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට ප්‍රතිපාදන වෙන් කර තිබුණු ප්‍රාග්ධන වැඩසටහන් 04 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) කර්තව්‍යන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

යෝජිත ආදාහනාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සඳහා 2017 දෙසැම්බර් 31 දින වන විට රු. 10,280,986 ක් වැය කර තිබුණද, එහි වැඩ නිමකර නොතිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**ප්‍රතිපූර්ණය කර නොගත් මැතිවරණ දීමනා**

2011 වර්ෂයේ පළාත් පාලන මැතිවරණ රාජකාරී වෙනුවෙන් මැතිවරණ කොමසාරිස්වරයාගෙන් ප්‍රතිපූර්ණය කරගත යුතු රු. 47,555 ක මුදලක් 2018 ජනවාරි 24 දින වන විටත් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

සභාවේ අනුමත කාර්ය මණ්ඩලයට අයත් තනතුරු 08 ක සේවකයින් 09 දෙනෙකුගේ පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

----------------------------

**3.4.1 පවරා නොගත් වත්කම්**

--------------------------

(අ) සභාව විසින් භාවිතයට ගනු ලබන පිරිවැය රු. 9,831,130 ක් වූ ඉඩම් 34 ක සහ පිරිවැය, රු. 7,074,583 ක් වූ ගොඩනැගිලි 26 ක නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගැනීමට 2018 ජනවාරි 24 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේ සිදු කරනු ලැබූ වත්කම් සමීක්ෂණය අනුව ඉඩම් 42 ක් අලුතින් හඳුනාගෙන තිබූ අතර, 2018 ජනවාරි 24 දින දක්වාම එම ඉඩම් සභාවට පවරා ගැනීමට හා වටිනාකම් තක්සේරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.4.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) අන්තර් සම්බන්ධිත කුට්ටිගල් සැකසීමේ යන්ත්‍රය 2016 වර්ෂයේ සිට කුට්ටිගල් සෑදීමේ කාර්යය සඳහා යොදා ගැනීමට හෝ බාහිර පාර්ශවයක් වෙත ලබාදී ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු බජාජ් ත්‍රීරෝද රථයක් 2016 වර්ෂයේ සිට ධාවනයේ නොයොදවා සභාවේ රථගාලේ රඳවා තිබුණි.

(ඇ) මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ඉතිරිකිරීමේ ගිණුමක රු. 274,306 ක් වූ ශේෂයක් 2015 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

**3.4.3 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

----------------------------

2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ සඳහන් නිර්දේශ තුනක් 2018 ජනවාරි 24 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.4.4 වාහන උපයෝජනය**

--------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) පිරිවැය රු. 7,219,000 ක් වූ වාහන 4 ක නීත්‍යානුකූල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු වාහන 11 ක් සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතු වුවත්, 2018 ජනවාරි 24 දින වන විටත් සභාව සතු වාහන 09 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ කැබ් රථයක් රු. 533,471 ක ඉන්ධන යොදවා කිලෝමීටර 49,930 ක් ධාවනය කර තිබූ නමුත්, ධාවන සටහන් ලිවීමේදී රාජකාරිය නිශ්චිතව දක්වා නොතිබුණු සහ වේලාව සටහන් නොකළ බොහෝ අවස්ථා පැවති අතර, අසාමාන්‍ය දුර ප්‍රමාණයන් සඳහන් කරමින් කැබ් රථයේ ධාවන සටහන් ලියා තිබූ අවස්ථාවන්ද තිබුණි.

## 3.5 ආර්ථික නොවූ ගණුදෙනු

---------------------------

දකුණු පළාත් සංවර්ධන සැලැසුම - 2017 යටතේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට ජලය සැපයීමේ ව්‍යාපෘතිය සඳහා නළ ළිඳක් ඉදිකිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් රු. 606,855 ක ඇස්තමේන්තුවක් ලබා ගෙන තිබුණු අතර, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භූමියේ නළ ළිඳක් ඉදිකිරීමට තරම් ප්‍රමාණවත් භූගත ජලය නොමැති වීම හේතුවෙන් අඟුණකොළපැලැස්ස නගරයේ පුරහල් භූමියේ නළ ළිඳ ඉදිකර තිබුණි. විධිමත් ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ව්‍යාපෘති යෝජනාව සකස් කිරීම නිසා, පුරහල් භූමියේ සිට කිලෝමීටර් 3 ක් පමණ දුරින් යකාගල ප්‍රදේශයේ පිහිටි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට ජලය සැපයීමේදී තවත් අමතර පිරිවැයක් දැරීමට සිදු වන බව නිරීක්ෂණය විය.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

--------------------------------------

## 4.1 අයවැය පාලනය

------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර, පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) වැය විෂයයන් 24 ක් සඳහා අයවැය ලේඛනය මගින් සලසා තිබූ එකතුව රු. 19,297,500 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු. 7,601,420 ක ඉතිරි කිරීම් නිරීක්ෂණය වූ අතර, එය සියයට 08 සිට සියයට 59 දක්වා පරාසයක පැවතුණි.

(ඇ) ආදායම් විෂයයන් 03 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු. 9,990,784 ක් වූ අතර, එම අගයයන් සියයට 20 සිට සියයට 30 දක්වා පරාසයක විය.

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

**------------------------------------**

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වන විට අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් වත් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

**5. පද්ධති හා පාලන**

**------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| **පද්ධතිය** | **අඩුපාඩුව** |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | i. ගිණුම් ශේෂ අත්හැරීම් මෙන්ම වටිනාකම් අඩුවෙන් හා වැඩියෙන් ගිණුම්ගත කර ඇති අවස්ථා පැවතීම. |
| | ii. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම් සහ උපයෝගී ලේඛනවල දැක්වුණු වටිනාකම් අතර වෙනස්කම් පැවතීම. |
| (ආ) ආදායම් පරිපාලනය | i. වරිපනම් බදු තක්සේරු කර අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. |
| | ii. නව ආදායම් උත්පාදන මාර්ග හඳුනා ගැනීම කෙරෙහි අවධානය යොමුවී නොතිබීම. |
| | iii. හිඟ මෝටර් ග්‍රේඩර් ආදායම් අයකරගෙන නොතිබීම. |
| (ඇ) වත්කම් පරිපාලනය | i. භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබීම. |
| | ii. අළුත්වැඩියා කර භාවිතයට යොදවාගත හැකි රථ වාහන අළුත්වැඩියා කර නොතිබීම. |
| | iii. වාහනවල අයිතිය පවරා ගෙන නොතිබීම. |
| (ඈ) අයවැය පාලනය | i. නිසි අධ්‍යයනයකින් හා ඇගැයීමකින් යුතුව ඇස්තමේන්තු සකස් කර නොතිබීම. |
| | ii. අයවැයගත සහ තථ්‍ය තත්ත්වයන් සසඳා බලා අයවැය ලේඛනය සංශෝධනය කර නොතිබීම. |